**ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 ජුනි 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුලි 01 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.6.1 (ආ) (iii) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ටෙන්ඩර් තැන්පතු ගිණුමට රු.3,845,000 ක මුදලක් වැරදි ලෙස හර කිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන දිනට වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ තැන්පතු ගිණුමේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයට අදාලව ටෙන්ඩර් තැන්පතු ගිණුමේ රඳවා තිබූ මුදල් රජයේ ආදායමට බැර කිරීමේදී වැඩිපුර බැර කර තිබූ රු.3,845,000 ක මුදල 2024 වර්ෂයේ අප්‍රේල් මස ගිණුම් සාරාංශ තුලින් නිවැරදි කර ඇත. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ නිවැරදි තැන්පතු ගිණුම් ශේෂය ඇතුළත් විය යුතු බව. |

**(ආ) දේපල පිරියත උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා රේගුව සතුව දැනට භාවිතයට ගන්නා ධාවන තත්ත්වයේ පවතින රු.68,500,000 ක් වටිනා වාහන 13ක් ගිණුම්ගත කර නොතිබීම නිසා මූල්‍ය නොවන වත්කම් වල අගය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණු අතර එකී වාහන සඳහා අලුත්වැඩියා වියදම්, රක්ෂණ වියදම් සහ අනෙකුත් සේවා වියදම් වශයෙන් රු.1,424,171 ක් දරා තිබුණි. | ශ්‍රී ලංකා රේගුව සතුව දැනට භාවිතයට ගන්නා රු.393,550,000ක වටිනාකමින් යුත් වාහන 102ක් ගිණුම්ගත කර ඇත. විමසුමේ සඳහන් වාහන සහ වටිනාකම් සම්බන්ධයෙන් පරීක්ෂාකර බලා නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | රේගුව සතු වාහන සියල්ල මූල්‍ය නොවන වත්කම්හි ඇතුලත් විය යුතු බව. |
| (ii) | 2022 වර්ෂයේ දී විකුණා තිබුණු වාහන 3 ක අගය වූ රු. 4,250,000 ක වටිනාකම ගිණුම් වලින් ඉවත් නොකිරීම නිසා මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | විමසුමේ සඳහන් වාහන සහ වටිනාකම් සම්බන්ධයෙන් පරීක්ෂාකර බලා නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | විකුණන ලද වත්කම්වල අගය ගිණුම්වලින් ඉවත් කළයුතු බව. |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් වටිනාකම රු. 4,171,150,000 ක් ලෙස දැක්වුවද, ඉඩම් කැබලි 16 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රේගුවට අයත් රජයේ ඉඩම් 09 ක තක්සේරු වටිනාකම් ලබා ගැනීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත 2023.05.29 දිනැති අංක Log/S/03/06-01B දරන ලිපිය යොමු කර ඇති අතර එහි සඳහන් ඉඩම් කැබලි 04 ක පමණක් තක්සේරු වටිනාකම් 2023.12.07 , 2024.01.19 දිනැති ලිපි මගින් ඉදිරිපත් කර ඇත. අනෙක් ඉඩම් කැබලි 05 හි තක්සේරු වටිනාකම් මේ වන තෙක් ලබා දී නොමැත. | රේගුව සතු ඉඩම් සියල්ල තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු බව |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් 2,204 දෙනෙකු සඳහා වැටුප්, වේතන, අතිකාල, නිවාඩු දින වැටුප් හා දිරිදීමනා වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් රු.2,055,010,979 ක් ද, රේගු අතිකාල නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු හා තොරතුරු තාක්ෂණ සන්නිවේදන අරමුදල මගින් රු.995,739,327 ක්ද වශයෙන් එකතුව රු.3,050,750,306 ක් ගෙවා තිබූ අතර එකී වියදම සම්බන්ධයෙන් තහවුරු කිරීමේ සාක්ෂිය වන සේවයට වාර්තා කළ බව සනාථ කෙරෙන ඇඟිලි සළකුණු යන්ත්‍ර වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා පොදු 18 ආකෘති පත්‍රය අනුව විධිමත් පරිදි අත්සන් ලේඛනයක් පවත්වා ගෙන යන බවට රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් විගණනයට දන්වා තිබුණ ද ආයතන අධ්‍යක්ෂ ජනරාල් ගේ 2023 සැප්තැම්බර් 26 දිනැති ලිපියෙන් එවැනි ලේඛනයක් භාවිතා කරන්නේ නම් එහි සඳහන් කරන වේලාවම ඇඟිලි සළකුණු යන්ත්‍රයේ ද සටහන් කිරීමට හැකිබව දන්වා තිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009 අනුව නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම, ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් සනාථ කළ යුතු වුවත්, රේගු දෙපාර්තමේන්තුවේ කාර්ය ස්වභාවය අනුව එය ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව දුෂ්කර වී ඇත. එබැවින්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා පොදු 18 ආකෘති පත්‍රය අනුව විධිමත් පරිදි අත්සන් ලේඛනයක් පවත්වා ගෙන යනු ලබන අතර, නිවාඩු ලේඛන සහ රේගු අතිකාල සඳහා වෙනම විධිමත් ලේඛනයක් ද පවත්වාගෙන යනු ලබන බවත් ඒ සඳහා මාණ්ඩලික නිලධාරියකු විසින් අනුමැතිය ලබා දීමෙන් සහ නිසි සනාථ කිරීමකින් පසු අතිකාල ගෙවීම් සිදු කරනු ලබයි. එබැවින් විගණනය සඳහා සාක්ෂි නොවීම යන නිරීක්ෂණය සමඟ එකඟ නොවන අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009 අනුව කටයුතු කර නොමැති වීමට පමණක් එකඟ වෙමි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම, ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් සනාථ කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

රේගු අධ්‍යක්ෂ ජනරාල් ආදායම් සංකේත 13 කට අදාලව ආදායම් ගණන්දීමේ නිලධාරියෙකු වශයෙන් කටයුතු කර තිබුණි. එම ආදායම් සංකේත සම්බන්ධව පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

| | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **මූලික ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තු ගත ආදායම** | | |
| | සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ආදායම රු. මිලියන 800,949 ක් වූ අතර පසුව එය රු. මිලියන 628,054 ක් දක්වා සංශෝධනය කර තිබුණි. එය මුල් ඇස්තමේන්තුවෙන් සියයට 22 ක අඩුකිරීමකි. වර්ෂය සඳහා රැස් කරන ලද සත්‍ය ආදායම රු. මිලියන 694,082 ක් වූ අතර එය මුල් ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 87 ක් විය. | විශ්ලේෂණාත්මක අධ්‍යයනයකින් පසුව මේ පිළිබඳව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | ඇස්තමේන්තු විචක්ෂණශීලීව සකස් කළ යුතු බව. |
| (ආ) | **පූර්ව වර්ෂයේ ආදායම සමඟ සැසඳීම** | | |
| | සමාලෝචිත වර්ෂයේ ආදායම් පූර්ව වර්ෂයේ ආදායම් සමඟ සැසඳීමේදී ආදායම් සංකේතාංක 05 කට අදාලව ආදායමෙහි සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණු අතර එය සියයට 3 සිට සියයට 35 ක් දක්වා වූ පරාසයක් ගෙන තිබුණි. | විශ්ලේෂණාත්මක අධ්‍යයනයකින් පසුව මේ පිළිබඳව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | ආදායම් වර්ධනය කළ හැකි ක්‍රමවේද පිළිබඳව අවධානය යොමුකළ යුතු බව. |
| (ඇ) | **හිඟ බදු ආදායම්** | | |
| | 2023 දෙසැම්බර් 31 දිනට රු.58,478,974,134 ක් වූ සමස්ත හිඟ බදු ආදායමෙන් රු.57,709,049,189 ක් හෙවත් සියයට 99 ක් 2020 වර්ෂයට ද පෙර සිට පැවත එන හිඟ බදු ආදායම් විය. පැරණි හිඟ බදු ආදායම්වලට අදාල තොරතුරු දෙපාර්තමේන්තුවෙන් සොයා ගැනීම අපහසු බව මෙම වාර්තාවේ කෙටුම්පතට පිළිතුරු වශයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මා වෙත වාර්තා | මෙලෙස වාර්තා වී ඇති හිඟ ආදායම් වටිනාකම අයකර ගැනීම සඳහා අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලිපි ඉදිරිපත් කර ඇත. මෙම හිඟ ආදායම් වටිනාකම්වලට අදාල තොරතුරු සොයා ගැනීමේ අපහසුතා ඇති හෙයින් ද ප්‍රවර්තන වර්ෂයන්හි හිඟ ආදායම් අය කර ගැනීම සඳහා අදාල | රජයට ලැබිය යුතු ආදායම් ප්‍රමාදයකින් තොරව රැස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |

| | | |
|---|---|---|
| කර තිබුණි. තවද, මෙම හිඟ ආදායම් "මහාභාණ්ඩාගාරයේ අනුමැතිය මත පසුව ගෙවීමේ පදනමට භාණ්ඩ නිදහස් කිරීම හේතුවෙන්" පැන නැගුණු බව මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබුණු බැවින් එවැනි අනුමැතීන් ලබා දීම සම්බන්ධව මහාභාණ්ඩාගාරයේ විශේෂ අවධානය යොමු කළ යුතුව පැවතුණි. | ආයතන වෙත ප්‍රතිපාදන වෙන් කර නොමැති හෙයින් ද අයකර ගැනීමේ ප්‍රගතිය ඉතා සුළු අගයක් ගෙන තිබේ. | |

## 2.2 වියදම් කළමනාකරණය

### 2.2.1 පුනරාවර්ථන වියදම්

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **ප්‍රතිපාදන ඉතිරිවීම**<br>සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් වැය විෂයයන් 19 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 10 සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් නිරීක්ෂණය විය. | ප්‍රතිපාදන අවශ්‍යතාවය 2022.06.30 දිනට පැවති කාර්යමණ්ඩලය මත පදනම්ව සකස් කළ අතර, එම කාර්ය මණ්ඩලයේ සේවකයින් විශ්‍රාම යාම, විදේශගත වීම, සේවයෙන් ඉල්ලා අස්වීම වැනි කරුණු හේතු කොටගෙන ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | ඇස්තමේන්තු විචක්ෂණශීලීව සකස් කළ යුතු බව. |
| (ආ) **වියදමේ විචලතාවයන්**<br>2022 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 13 ක වියදම් වැඩි වී තිබුණු අතර ඒ අනුව වියදම් සීමා කිරීමක් සිදු වී නොතිබුණි. | මෙයට අදාල විස්තර කිරීම ඉදිරිපත් කර ඇත. | හැකි සෑම විටම වියදම් සීමා කිරීමට උත්සාහ දැරිය යුතු බව. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **අනිකුත් බැඳීම් හා බැරකම්**<br>මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැරකම් විස්තරයේ සහ බැරකම් ලේඛනයේ ඇතුළත් නොවූ වැය විෂයයන් 08කට අදාළව 2024 වර්ෂයේ දී ගෙවූ බැරකම් එකතු වටිනාකම රු. 34,767,112 ක් විය. | අදාල අංශ වෙතින් ලබාදී ඇති බැරකම් ලැයිස්තු අනුව බැරකම් ප්‍රකාශනය නිවැරදිව ඉදිරිපත් කර ඇති අතර රේගු දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම උදෙසා මෙම වවුචර්පත් සඳහා ගෙවීම් සිදු කර ඇත. | බැඳීම් හා බැරකම් ලේඛනය තුළ සියලු වගකීම් දැක්විය යුතු බව. |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු අතර එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ජාතික විගණන පනතේ 38 වගන්තිය ප්‍රකාරව ගණන් දීමේ නිලධාරියා විසින් සිදු කළ යුතු සමාලෝචනය ලිඛිතව සිදු කිරීමට අතපසු වී ඇති අතර, එය ඉදිරියේදී නිවැරදිව සිදු කිරීමට සටහන් කර ගන්නා ලදී. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | <br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1968 අංක 17 දරන රේගු ආඥා පනත | | | |
| (i) | 84 (අ) (3) වගන්තිය | (i)බන්දිත ගුදම් පහසුකම (Manufacture in Bond) ලබාගන්නා විට ගුදම්ගත භාණ්ඩ දේශීය පරිහරණය සඳහා ගුදමින් මුදාහරින අවස්ථාවේදී "ආනයනය කරන ලද භාණ්ඩ සේ සලකා" තීරු බදු ගණන් බැලීම සහ ගෙවීම් සිදු කළ යුතුය. කෙසේවුවද, දේශීයව සියයට 30 ට නොඅඩු අගයක් එකතු කර වාහන නිෂ්පාදනය කරන්නන්ට කර්මාන්ත අමාත්‍යවරයාගේ | මෙම කරුණ පිළිබඳව ඉදිරි කටයුතු කිරීමට නීතිපති උපදෙස් ඉල්ලා ඇත. | රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |

| | | |
|---|---|---|
| නිර්දේශ මත ලබා දෙන සියයට 70ක නිෂ්පාදන බදු සහනය එකී බන්දිත ගුදම් පහසුකම් ලබාගන්නා වාහන උපාංග එකලස් කරන සමාගම් දෙකක් විසින් ද ලබා ගැනීමට කටයුතු කර තිබුණු අතර රේගුව විසින් ද ආඥා පනතේ යොමුගත ප්‍රතිපාදන නොසලකා හැර එකී බදු සහනය ලබා දීමට කටයුතු කර තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේදී අදාළ සමාගම් දෙක විසින් වාහන 326 ක් ගුදමේ එකලස් කර දේශීය වෙළඳපලට නිකුත් කර තිබුණු අතර එකලස් කරන ලද වාහන ගුදමින් මුදාහරින විට අය විය යුතු නිෂ්පාදන බද්ද රු.350,432,000 ක් වුවද රු.246,628,800 ක් පමණක් අයකර තිබීම නිසා රාජ්‍ය ආදායම රු.103,803,200 න් අඩු වී තිබුණි. | | |
| (ii) වාහන එකලස් කරන එවැනි එක් සමාගමක් විසින් වාහන වර්ග 2කට අදාලව 2023 වර්ෂයේ දී සියයට 30 ක නිෂ්පාදන බදු ගෙවා රේගු ගුදමෙන් වාහන නිදහස් කරගෙන ඉතා ඉහළ වෙළඳපල මිල ගණන් වලට ඒවා විකුණා අති විශාල ලාභයක් උපයා තිබුණි. ඒ අනුව ගුදමෙන් පිටවන විට පිරිවැය රු.6,307,763 ක් වූ එක් වාහන වර්ගයක වැට් බදු රහිත වෙළඳපල අලෙවි මිල රු.11,525,423 ක් වී තිබුණු අතර අනෙක් වාහන වර්ගයේ ගුදමෙන් පිටවන විට පිරිවැය රු.9,782,658 ක් වී වැට් රහිත අලෙවි මිල රු.13,555,084 ක් වී තිබුණි. ඉහත වාහන වර්ග දෙකෙහි පිරිවැය සහ වෙළඳපල අලෙවි මිල අතර පිළිවෙලින් රු.5,217,660 ක සහ රු.3,772,426 ක වෙනසක් විය. | විගණන නිරීක්ෂණය හා එකඟ වෙමි. | රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 153 (2) (ආ) වගන්තිය | ශ්‍රී ලංකා රේගුවේ ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කල යුතු වුවද, 1988 ජනවාරි 28 දිනැති අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 2012 වසරේ සිට 2023 වර්ෂය දක්වා වූ වර්ෂ 12 ක් තුළ ත්‍යාග අරමුදල් ලෙස නිලධාරීන් සඳහා රු.19,429,331,820ක්ද, ඔත්තුකරුවන් සඳහා රු.2,980,886,848 ක් ද බෙදා හැර තිබුණි. මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ඇති ලියකියවිලි ආයතනය තුළින් සොයා ගැනීමට මේ වන විට නොහැකිවී ඇති බව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි. | රේගු දෙපාර්තමේන්තුවේ ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීමට අදාල 1988.01.28 දිනැති පීඑල් 118 දරණ දෙපාර්තමේන්තු නියෝගය අභියාචනාධිකරණය විසින් ගුණතිලක එදිරිව වීරසේන නඩුවේ තීන්දුවට අනුව වලංගු මෙන්ම ක්‍රියාකාරී හා බලාත්මක කළ හැකි ලේඛනයක් බව ප්‍රකාශයට පත්තර ඇති බැවින්, එය නඩු තීන්දුමය නීතියක් (Case Law) බවට පත් වේ.<br>එමෙන්ම, රේගු ත්‍යාග මුදල් බෙදා හැරීමට අදාල පීඑල් 118 දරණ දෙපාර්තමේන්තු නියෝගය නිසි යාන්ත්‍රණයක් ඔස්සේ අවශ්‍ය අනුමැතියන් සහිතව නිකුත් කර ඇති ලියවිල්ලක් බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇති බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් එවන ලද E/248/2002 දරණ 2002.12.31 දිනැති ලිපිය මගින් ලබාදී ඇති නෛතික පැහැදිලි කිරීමට අනුව ද පෙනී යයි.<br>ඒ අනුව, රේගු ත්‍යාග අරමුදලින් නිලධාරීන් හා ඔත්තුකරුවන් සඳහා ගෙවා ඇති ත්‍යාග මුදල් සඳහා පැහැදිලි නෛතික පදනමක් තිබෙන බවත්, අදාල ත්‍යාග මුදල් ලබා දීම රේගු ආඥා පනතට අනුව සිදුකර ඇත. | රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | 162 වගන්තිය | යොමුගත වගන්තිය ප්‍රකාරව අල්වා ගැනීමෙන් පසු නීති විරෝධී බැව් ප්‍රකාශ කළ බඩු සම්බන්ධයෙන් හැකි පමණ ඉක්මනින් සුදුසු පරිදි ක්‍රියාකළ යුතු වුවද, වටිනාකම තහවුරු නොකළ වසර 02 සිට වසර 12 දක්වා පැරණි විවිධ ආහාර ද්‍රව්‍ය, බෙහෙත් වර්ග සහ පොහොර ආදිය සහිත බහාලුම් 39 ක් ද, වසර 01 සිට 05 දක්වා පැරණි විවිධ ද්‍රව්‍ය අඩංගු බහාලුම් 448 ක් ද, අන්තර්ගත ද්‍රව්‍ය ඇති/නැති බව නොදන්නා වසර 05 සිට වසර 10 ක් දක්වා පැරණි බහාලුම් 116 ක් ද, වසර 10 ට වැඩි බහාලුම් 38 ක් ද, සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වා විවිධ ස්ථානවල රඳවා තිබුණි. තවද, වසර 01 සිට වසර 06 ක් දක්වා පැරණි රු.186,058,922 ක් වටිනා සහල් සහිත බහාලුම් 53 ක් මිනිස් පරිභෝජනයට නුසුදුසු මට්ටමක පවතින නමුත් පාරිභෝගික සේවා අධිකාරිය මගින් පළකරන ලද ගැසට් පත්‍රයක් හේතුවෙන් ඒවා සත්ත්ව ආහාර වශයෙන් යොදා ගැනීමට ද නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බව විගණනයට වාර්තා කර තිබුණි. | සහල් සහිත බහාලුම් 53 ක් 2019 වර්ෂයේ සිට නිදහස් කිරීමට නොහැකිව ඇත්තේ එම බහාලුම් සමඟම ආනයනය කරන ලද වෙනත් සහල් අඩංගු බහාලුම් සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ නඩුවක් පැවතීම හේතුවෙන් ඒවා නිදහස් කර ගැනීම සඳහා රේගු සටහන් කර ඉදිරිපත් කර නොමැති බැවිනි. ඉන්පසුව අභියාචනාධිකරණයේ තීරණය මත අදාල බහාලුම් නිදහස් කර ගැනීමට රේගු සටහන් කර ඉදිරිපත් කළද, ඒවා මිනිස් පරිභෝජනයට නුසුදුසු මට්ටමට පැමිණ ඇති බවට රජයේ රස පරීක්ෂක වාර්තා මගින් තහවුරු කර ඇත. එමෙන්ම 2022.06.24 දින පාරිභෝගික සේවා අධිකාරිය මගින් පළකරන ලද 2285/18 දරණ ගැසට් පත්‍රය මගින් ආනයනික සහල් සත්ත්ව ආහාර සඳහා මූල ද්‍රව්‍යයක් ලෙස යොදා ගැනීම වළක්වා ඇත. එම නිසා අදාල බහාලුම් නිදහස් කිරීමට නොහැකි වී ඇත. | රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) | XXIV පරිච්ඡේදයේ 4 වන උප | • සමාලෝචිත වර්ෂය අවසාන දිනට මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 10 ට වඩා | මියගිය නිලධාරීන් අතුරින් සමහර දෙනෙකුගේ නිරවුල් | ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට |

| | | | | |
|---|---|---|---|---|
| | වගන්තිය | පැරණි ණය ශේෂය රු.217,016 ක් ද, වර්ෂ 01 සිට 03 දක්වා පැරණි ණය ශේෂය රු.626,014 ක් ද, වසරකට වඩා අඩු ණය ශේෂය රු. 323,954 ක් ද විය. | නොවූ ණය ශේෂ පිළිබඳව තොරතුරු රැස් කරමින් පවතින අතර සමහරකගේ මරණ පාරිතෝෂිකය මේ දක්වා ගෙවා නොමැත. | අනුගත විය යුතු බව. |
| | | • සමාලෝචිත වර්ෂය අවසාන දිනට විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 10 ඉක්මවූ ණය ශේෂය රු.349,446 ක් ද, වර්ෂ 03 සිට 10 දක්වා පැරණි ණය ශේෂය රු.556,817 ක් ද, වර්ෂ 01 සිට 03 දක්වා පැරණි ණය ශේෂය රු.50,855 ක් ද, වසරකට වඩා අඩු ණය ශේෂය රු. 1,530,130 ක් ද විය. | සමහර නිලධාරීන්ගේ විශ්‍රාම පාරිතෝෂිකය සකස් කරමින් පවතින අතර සමහරකගේ විස්තර එක් රැස් කරමින් පවතී. | |
| | | • ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් වර්ෂ 10 ක් ඉක්මවූ ණය ශේෂය රු.394,007 ක් ද, වසරකට වඩා අඩු ණය ශේෂය රු.373,393 ක් ද පියවීමට පියවර ගෙන නොතිබුණි. | ණය ශේෂ හරස් සටහන් මඟින් පියවීම පිළිබඳව ඔවුන් සේවය කරන ස්ථානවලට දැනුම් දී ඇත. | |
| | | • වැඩ තහනම්කර ඇති නිලධාරීන්ගෙන් වසර 10 ට වඩා වැඩි ණය ශේෂය රු. 1,243,542 ක් ද, වර්ෂ 01 සිට 10 දක්වා පැරණි ණය ශේෂය රු.233,836 ක් ද වූ අතර සේවය හැර ගිය නිලධාරීන්ගෙන් වර්ෂ 10 ට වඩා වැඩි ණය ශේෂය රු.473,073 ක් ද, වසර 1 සිට 3 දක්වා ණය ශේෂය රු.226,304 ක් ද වසර 1 ට අඩු ණය ශේෂ රු.286,527 ක් විය. අදාල නිලධාරීන්ගෙන් මෙම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුව පැවතුණි. | සමහර නිලධාරීන්ගේ විනය පරීක්ෂණ කටයුතු කරමින් පවතින අතර සමහරකගේ විස්තර එක් රැස් කරමින් පවතී. සිහි කැඳවීම් ද යවා ඇත. | |
| (ii) | XLVIII පරිච්ඡේදයේ 13 වගන්තිය | සහකාර රේගු අධිකාරිවරයෙක් විසින් 2020 වර්ෂයේ දී සිදු කරන ලද මුදල් වංචාවක් සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා | මේ පිළිබඳව පරීක්ෂා කර ඉදිරි කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | විමර්ශණ කොමිෂන් සභාවට පැමිණිලි කර තිබුණු අතර අදාළ වංචාව පිළිබඳ තොරතුරු රේගුව සතුව නොපැවතීම හේතුව වශයෙන් දක්වමින් නිලධාරියා පිළිබඳව 2023 දෙසැම්බර් 31 දින වන විට ද දෙපාර්තමේන්තු පරීක්ෂණ කිසිවක් පවත්වා නොතිබුණි. | | |
| (ඇ) | 2008 ජුනි 13 දිනැති අංක LD- 1,34(I) 2008 දරන ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛය | රජය සතු ඉඩම් අනවසරෙන් අල්ලා ගැනීම පාලනය හා කළමනාකරණය විධිමත් කිරීමට කටයුතු නොකර කොම්පඤ්ඤ වීදියේ මෝගන් පාරේ ශ්‍රී ලංකා රේගුව සතු නිල නිවාස භූමියේ අනවසර පදිංචි කරුවන් 18 දෙනෙකු පදිංචිව සිටින අතර චක්‍රලේඛය අනුව අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෝගන් පාර අංක 40 දරණ ස්ථානයේ පිහිටි නිවාස සංකීර්ණයේ අනවසර පදිංචිකරුවන් ඉවත් කර දෙන ලෙස කොළඹ ප්‍රාදේශීය ලේකම් වෙත නැවත දැනුම් දීමක් කර ඇත. අදාළ ඉඩම් කොටස රේගු දෙපාර්තමේන්තුවට පවරා දීමෙන් පසුව අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව 2024 පෙබරවාරි 28 දිනට ඉදිරිපත් නොකළ බැවින් එකී වාර්තාවේ සඳහන් සංඛ්‍යා හා අනෙකුත් තොරතුරුවල නිවැරදිතාවය විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකි විය. | 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගතවීමට පෙර ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ජාතික විගණන පනතේ සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කාර්යසාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 දෙසැම්බර් 31 දින වන විට රේගුවේ විවිධ අංශ විසින් සිදුකරන රේගු විමර්ශන 8450 ක් පැවතුණි. ඉන් විමර්ශන 3080 ක් වසර 05කට වඩා ද, විමර්ශන 4348 ක් වසර 02 සිට වසර 04ක් දක්වා ද, විමර්ශන 1022 ක් වසරක් තුළද වශයෙන් නොවිසඳී පැවතුණි. විමර්ශන ප්‍රමාදවීම මත අත් අඩංගුවට ගත් භාණ්ඩ නශ්‍ය වීම, හායනය වීම, පසු කාලීන අලෙවියෙන් නිසි වටිනාකමක් ලබා ගැනීමට නොහැකි වීම, ඔත්තුකරුවන් සහ නිලධාරීන් අධෛර්යයට පත් වීම ආදී අවාසිදායක තත්ත්වයන් පැන නැගී තිබුණි. | 2015 ජූලි මස සිට 2024.01.01 දිනට අදාල සමස්ත රේගු විමර්ශන කටයුතු පිළිබඳ තොරතුරු 2024.01.01 දින වන විට ඉලෙක්ට්‍රොනික මධ්‍යගත තොරතුරු පද්ධතියට අනුව දක්වා ඇත. | විමර්ශන කඩිනම්ව අවසන් කිරීමට කටයුතු කළයුතු බව. |
| (ඇ) | රේගු වැරදි වැළැක්වීමට බහාලුම් පරීක්ෂාවේ දී පරිලෝකන පද්ධතියක් හඳුන්වා දී තිබීම, අනෙකුත් සම්බන්ධිත ආයතන අතර පද්ධති සම්බන්ධ කිරීමට කටයුතු කිරීම සහ විමර්ශන මත පදනම්ව රේගු නිලධාරීන්ට ත්‍යාග ක්‍රමයක් හඳුන්වා දී තිබීම ආදී වූ තත්ත්වයන් තිබියදී සමාලෝචිත වර්ෂය තුළ දී අවසන් කරන ලද විමර්ශන සඳහා පාදක වූ රේගු වැරදි 1902 ක් අතුරින් අතිරික්ත භාණ්ඩ ආනයන අවස්ථා 224 ක්ද, ප්‍රකාශ නොකළ භාණ්ඩ ආනයනයන් 498 ක්ද, වටිනාකම අඩුවෙන් ප්‍රකාශ කර ආනයනය කිරීම් 207 ක්ද, තහනම් කරන ලද හෝ සීමා කරන ලද භාණ්ඩ ආනයනයන් 188 ක්ද, රේගු ආඥා පනත උල්ලංඝනය කරන ලද වෙනත් අවස්ථා 211 ක්ද, ආදී රේගු වැරදි හඳුනාගත හැකි විය. කෙසේවුවද. නීතිය බලාත්මක කිරීම හා පහසුකම් සැලසීම සඳහා තීරණ ගැනීමට උපයෝගී කරගත හැකි, ඉදිරි අවශ්‍යතා වලට අනුකූලව වැඩිදියුණු කරගැනීමේ හැකියාවෙන් ද යුක්ත "ස්වයංක්‍රිය අවදානම් කළමනාකරණ පද්ධතියක්" (Automated Risk Management System) රේගුව තුළ ස්ථාපිත කිරීමට කටයුතු කරගෙන යන බව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළිතුරු ලෙස මා වෙත වාර්තා කර තිබුණි. | ආනයන භාණ්ඩ නිශ්කාෂන ක්‍රියාවලිය අවදානම් පදනම් කරගත් ක්‍රියාවලියක් මඟින් විධිමත් කිරීම, දැනටමත් රේගු අවදානම් කළමනාකරණ අංශයේ මූලිකත්වයෙන් සිදුකර ඇත. එය කළමනාකාරිත්වය මඟින්ද අත්‍යවශ්‍ය ක්‍රියාවලියක් ලෙස හඳුනාගෙන ඇති අතර, රේගු කටයුතුවලදී පාර්ශවකරුවන් වන ආනයනකරුවන්, අපනයනකරුවන්, වාප්පු නියෝජිතයන් ආදීන්ද, භාණ්ඩ, රටවල්, ගෙවීම් ක්‍රම ආදී නොයෙකුත් නිර්ණායක පදනම් කරගෙන, අදාල පාර්ශවවල පූර්ව හැසිරීම් හා පූර්ව දත්ත හා ඉදිරි නැඹුරුතා ද විශ්ලේෂණය කිරිමේ හැකියාව ඇති, අදාල පරිදි නීතිය බලාත්මක කිරීම හා පහසුකම් සැලසීම සඳහා තීරණ ගැනීමට උපයෝගී කරගත හැකි, ඉදිරියේදි පැමිණිය හැකි අවශ්‍යතා වලටද අනුකූලව වැඩිදියුණු කරගැනීමේ හැකියාවෙන් යුක්ත "ස්වයංක්‍රිය අවදානම් කළමනාකරණ පද්ධතියක්" (Automated Risk Management System) ශ්‍රී ලංකා රේගුව තුළ ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරගෙන යමින් පවතී. | රේගු වැරදි හඳුනාගැනීම සහ වැළැක්වීම සඳහා නවීන තාක්ෂණ ක්‍රමවේද භාවිතා කළ යුතු බව. |

**3.2 අනාර්ථික ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉන්දියාවේ සිට සුදු සීනි ලෙස අනාවරණය කර ආනයනය කරන ලද සීනි තොගයක් රේගුවේ අවදානම් කළමනාකරණ ඒකකය **(RMU)** මගින් දැඩි අවදානම් සහිත බවට වර්ගීකරණය කර ගැඹුරින් පරීක්ෂාවට යොමුකර තිබුණ ද, එම කාර්යය නිසි ලෙස සිදු නොවීම හා තෝරාගත් නියැදිය දෝෂයන් හඳුණා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවීම නිසා එම බහාලුම් තුළ දුඹුරු සීනි තොගයක්ද තිබිය දී රේගුවෙන් භාණ්ඩ නිෂ්කාශනය කර තිබුණි. කෙසේවුවද, අනුකූලතා හා පහසුකම් සැලසීමේ අංශයට පසුව ලද තොරතුරකට අනුව සිදු කරන ලද පරීක්ෂාවේ දී ප්‍රකාශ නොකරන ලද දුඹුරු සීනි බහාලුම් 20 ක් ද එහි ඇති බවට අනාවරණය කරගෙන තිබුණි. මේ පිළිබඳව කරන ලද විමර්ශන අවසානයේ ආනයනකරුට එරෙහිව රු.500,000 ක දඩයක් සහ රු.189,293,778 ක අභිමි කිරීමක් පනවා තිබූ අතර ආනයනකරු එකී දණ්ඩනයට එකඟවීම මත රාජසන්තක නොකර රු.190,000,000 ක බැංකු ඇපකරයක් මත භාණ්ඩ තොගය රේගු භාරයෙන් නිදහස් කරගෙන තිබුණි. ඒ අනුව පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | පනවන ලද දණ්ඩනයක් රේගු ආඥා පනතේ 165 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයාට ලිහිල් කල හැකි අතර මෙම ආනයනකරු විසින් එවැනි ලිහිල් කිරීමකට කරන ලද අභියාචනය පළමු අවස්ථාවේදී අමාත්‍යවරයා ප්‍රතික්ෂේප කර තිබුණි. එහෙත්, පනවන ලද දණ්ඩන මුදල පසුව රු.මිලියන 30 කින් අඩු කිරීමට අමාත්‍යවරයා විසින් අනුමැතිය දී තිබුණි. | ගරු මුදල් අමාත්‍යවරයා විසින් දණ්ඩන මුදල රුපියල් මිලියන 30 කින් ලිහිල් කිරීමට තීරණය කර තිබුනේ රේගු ආඥා පනතේ 165 වගන්තිය අනුව වේ. | දණ්ඩනයක් ලිහිල් කිරීමේදී රේගු ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ii) | මෙම රේගු වරද නිසා රජයට සිදුවූ පාඩුව රු.56,106,333ක් විය. | ප්‍රශ්නගත දුඹුරු සීනි තොගය වූ මෙට්‍රික් ටොන් 607.55 ප්‍රමාණය නීත්‍යානුකූලව ආනයනය කලේ නම්, ඒ සඳහා ගෙවිය යුතු බදු මුදල රු. 56,410,083 ක් බව රේගු පරීක්ෂණය තුල දී ගණනය කිරීමේ ක්‍රියාවලිය තුලින් නිරීක්ෂණය විය. සුදු සීනි සහ දුඹුරු සීනි යන වර්ග දෙකෙන්ම යුක්ත වූ මුළු සීනි තොගයෙහි බර මෙට්‍රික් ටොන් 1,214.90 ප්‍රමාණයක් වන අතර, එකී මුළු ප්‍රමාණයම සුදු සීනි ලෙස ප්‍රකාශ කරමින් රු. 303,750.00 ක බදු මුදලක් ආනයනකරු විසින් රජයට ගෙවා තිබුණි. | රජයට ලැබිය යුතු නියමිත බදු ආදායම අයකරගත යුතු බව. |
| (ආ) | **වසර 5ට අධික කාලයක සිට මුදා නොගත් බහාලුමකට අදාළව ආනයන සටහන්කර ක්‍රියාත්මක කිරීම** | | |
| | 2017 ජුනි 13 දින ජපානයෙන් කොළඹ වරායට ළගාවූ අංක **MSK** 8912638 දරන බහාලුමේ පාවිච්චි කරන ලද යන්ත්‍ර සහ යතුරු පැදි අඩංගු වූ නමුත් ආනයනකරු විසින් භාණ්ඩ මුදාහැරීමට රේගු ලියකියවිලි ඉදිරිපත් නොකිරීම නිසා 2018 මාර්තු 29 දින වන විට රේගු විමර්ශනයක් ආරම්භ කර තිබුණි. කෙසේවුවද**,** වසර 5 ක පමණ කාලයක් තිස්සේ මුදා නොගත් මෙම බහාලුමට අදාළව 2022 අප්‍රේල් 07 දින ආනයන සටහන්කරයන් රේගුවට ඉදිරිපත්වී තිබුණු අතර රේගු විමර්ශන ක්‍රියාත්මකව පැවතිය දී බහාලුමේ අඩංගු භාණ්ඩ සඳහා 2022 ජුනි 27 දින වන විට රු.2,484,411 ක තීරු බදු අය කර රේගු ප්‍රකාශන අංශයේ කටයුතු අවසන් කර තිබුණි.මෙම අවස්ථාවේදී රේගු දත්ත මෝටර් රථ දෙපාර්තමේන්තු දත්ත පද්ධතියට සම්ප්‍රේෂණය වී තිබුණු අතර භෞතික විගණන පරීක්ෂාව සිදු කරන ලද 2023 සැප්තැම්බර් 15 දින වන විට ද ප්‍රශ්නගත බහාලුම කොළඹ වරායෙන් මුදා නොගෙන තිබිය දී වාහන 2ක් මෝටර් රථ | රේගු ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති වාහනවල විස්තර අඩංගු කොටසේ තිබූ දත්තයන් සැක සහිත වූ බැවින්, රේගු ප්‍රකාශනය සැකසීම (process) රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන) මගින් තාවකාලිකව අත්හිටුවන බව දැනුම් දී ඇත්තේ 2022.04.29 දින දීය. 2022.05.30 දරණ අභ්‍යන්තර ලිපිය මගින් රේගු අධ්‍යක්ෂ (නිවාරණ) රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන) වෙත දැනුම් දී ඇත්තේ MSKU8912638 දරණ බහාලුම පරීක්ෂා කිරීමට අවශ්‍ය බවත්, ඒ සඳහා ඉහත කී රේගු ප්‍රකාශනය ඉදිරි රේගු විමර්ශන කටයුතු සඳහා සාමාන්‍ය ක්‍රියා පටිපාටිය ඔස්සේ සැකසීම (process) කරන ලෙසත්, ප්‍රකාශිත අයිතමයන්වල වෙනස්කම් නිරීක්ෂණය වුවහොත් ඊට අදාල ක්‍රියාමාර්ග රේගු ආඥා පනතේ 47 වගන්තිය යටතේ ගන්නා බවත් පවසමිනි. ඒ අනුව එම රේගු ප්‍රකාශනයට අදාල බදු මුදල් ගෙවීම 2022.06.03 දින සිදු කර ඇති අතර, දැනට එම බහාලුම CICT අංගනයේ රඳවා ඇති අතර, පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතී. | ආනයන සටහන්කරයන්හි ඇතුළත් දත්ත පිළිබඳව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතියට රේගු දත්ත සම්ප්‍රේෂණය වීමේ දී එකී දත්තවල වලංගුභාවය පිළිබඳව සැලකිලිමත් විය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබුණි. ඒ අනුව විමර්ශනයක් සිදු කරමින් පවතින අතරතුර සහ ආනයන සටහන්කරයේ සැක සහිත වැසි අංක තිබිය දී ඒ පිළිබඳව නිසි සැලකිල්ලක් නොදක්වා රේගුව තීරු බදු අය කිරීමට කටයුතු කර තිබුණු අතර මෝටර් රථ දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියට දත්ත සම්ප්‍රේෂණය වීමට ඉඩ හැරීම තුළ බහාලුම වරායේ රඳවා තිබිය දී එහි අඩංගු භාණ්ඩ සඳහා මෝටර් රථ දෙපාර්තමේන්තුවේ වාහන අනීතිකව ලියාපදිංචි වීමට ද රේගුව වක්‍රව අනුබල දී තිබුණි. | | |
| (ඇ) | වාර්ෂිකව රු.41,850,000ක කුලී මුදලක් ගෙවමින් රේගුව විසින් මට්ටක්කුලිය ප්‍රදේශයේ පෞද්ගලික සමාගමකින් ලබා ගෙන තිබුණු ඉඩමක 2023 දෙසැම්බර් 31 දිනට අත් අඩංගුවට ගන්නා ලද වාහන 435ක් රඳවා තිබුණු අතර ඒවායින් වාහන 152 ක් වසර 5ට පෙර අත් අඩංගුවට ගත් ඒවා විය. රුහුණු පුර වරාය භූමියේ ද තවත් වාහන 202 ක් රඳවා තිබුණු අතර එහි වසර 5ට පෙර අත් අඩංගුවට ගත් වාහන 36 ක් විය. මෙම සියලු වාහනවලට අදාලව මෙරටින් විනිමය වැයවීමක් සිදු වී තිබියදී දිගු කාලයක් අංගනවල ගාල් කර තැබීම හේතුවෙන් වාහන දිරාපත් වී ධාවනයට නුසුදුසු තත්ත්වයට පත්වීම සහ වෙන්දේසියකින් සාධාරණ මුදලක් ඉපයීමට නොහැකි තත්ත්වයක් ද ඇති වී තිබුණි. | සියළුම වාහනවලට අදාලව මෙරටින් විනිමය වැයවීමක් සිදුවූයේද යන්න පිළිබඳව නිශ්චිත අදහස් දැක්වීමක් සිදු කළ නොහැක. බොහොමයක් වාහන සඳහා තවමත් පරීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී. වෙන්දේසියකින් සාධාරණ මුදල් ඉපයීමට නොහැකිවීම පිළිබඳව ද නිශ්චිත අදහස් දැක්වීමක් සිදු කළ නොහැක.අනෙකුත් අදහස් දැක්වීම් වලට එකඟයි. | මෙම වාහන සම්බන්ධයෙන් සුදුසු කටයුතු කඩිනම්ව සිදුකර අවසන් කළයුතු බව. |

**3.3 කළමනාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුද්ගලික සමාගමක් විසින් ව්‍යාජ ඉන්වොයිසි ඉදිරිපත් කර ආනයනය කරන ලද සත්ව ආහාර තොගයකට අදාළව එම සමාගම පැහැර හැරීමට උත්සාහ දැරූ බදු | එකී රු. 500,000/-ක මුදල ලිහිල් කරන ලද අභිමි කිරීමක් ලෙස රේගු ආඥා පනතේ 129 සහ 163 වගන්ති යටතේ පනවා ඇත්තේ | රජයට ලැබිය යුතු නියමිත බදු ආදායම අයකරගත යුතු බව. |

වටිනාකම රු.15,198,755 ක් වූ අතර අඩුවෙන් දැක්වූ භාණ්ඩ වටිනාකම (Under Value) රු.63,519,586 ක් විය. කෙසේවුවද, විමර්ශන අවසානයේ දී වංචා කිරීමට උත්සාහ කළ තීරු බදු වටිනාකම සඳහා රු.500,000 ක ලිහිල් කරන ලද අහිමි කිරීමක් ද අඩුවෙන් දැක්වූ භාණ්ඩ වටිනාකම සඳහා රු.19,000,000 ක අහිමි කිරීමක්ද පමණක් පැනවීමට කටයුතු කර තිබුණු අතර එය සිදු කරන ලද වරදට සාපේක්ෂව විශාල ලිහිල් කිරීමක් විය. මෙකී ආනයනකරු විසින් 2021 සහ 2022 වර්ෂවල දී පමණක් ආනයනික අවස්ථා 300ට අධික සංඛ්‍යාවක් සිදු කර තිබුණු අතර එකම වාජ්පු ලිපිකරු සේවයකින් දිගින් දිගටම වාජ්පු සේවය ලබාගෙන තිබුණි. කෙසේවුවද, අදාළ වාජ්පු සේවාව සම්බන්ධව දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණු අතර “වාජ්පු ලිපිකරුවන්ගේ ඇතැම් වංචනික ක්‍රියා නිසා රජයට බදු මුදල් අහිමි වන තත්ත්වය වළක්වා ගැනීම සඳහා පවතින නෛතික ප්‍රතිපාදන සංශෝධනය කළ යුතු බවට” රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව මඟින් ද දෙපාර්තමේන්තුවට නියෝග ලබා දී තිබුණි.

(ආ) මිනිස් පරිභෝජනයට නුසුදුසු මාළු කන්ටේනර් 102 ක් රේගුවෙන් නිදහස් කිරීම

සී ෂෙල්ස් සිට තායිලන්තය දක්වා ගමන් කළ මත්ස්‍යයින් ගබඩා කළ බහාළුම් රැගත් නෞකාවක් කොළඹ වරායට ආසන්න මුහුදු ප්‍රදේශයේ දී කාර්මික දෝෂයකට ලක් වී විදුලි සැපයුම නතර වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වරායට ළඟා වී තිබුණු අතර එහි බහාළුම් 98 ක තිබුණු නරක් වූ මාළු තොගය විදේශීය නෞකාවේ දේශීය නියෝජිතයා මඟින් සොයාගත් දේශිය පෞද්ගලික ආයතනයකට කාබනික පොහොර නිෂ්පාදනය සඳහා 2022 මාර්තු 09 වන දින විකුණා තිබීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

වංචා කිරීමට උත්සාහ කරන ලද තීරු බදු වටිනාකමට නොව, රේගු වරද දැනුවත් භාවයෙන් යුතුව සිදු කර තිබීම යන තත්ත්වය සැලකිල්ලට ගැනීමෙනි. එකී විමර්ශන ලිපිගොනුවට අනුව, රේගු දණ්ඩන මුදල් පනවා ඇත්තේ විධිමත් රේගු පරීක්ෂණයක් පැවැත්වීමෙන් (customs inquiry) පසුවයි. තවද, විමර්ශන නිලධාරියා විසින් ලිහිල් කරන ලද අහිමි කිරීම සිදු කිරීම රේගු නීති ප්‍රතිපාදනවලට අනුව නෛතික රාමුව තුළ සිදු කර ඇත.

**(i)** මෙම මාළු තොගය අඩංගු නෞකාවෙහි ස්වභාවය Transshipment Status වුවද Import cargo status ලෙස වෙනස් කිරීමට මෙමගින් පෙන්වා දී ඇති පරිදි දැනට ඉතිරිවී ඇති බහාලුම් 15 ප්‍රතිඅපනයනය සඳහා නොව මාළු තොගය නරක් වූ ස්වභාවයක් ගෙන ඇති

| | | | |
|---|---|---|---|
| | ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂවරයා පත් කරන ලද කමිටුව විසින් තීරණය කර තිබුණ ද ඒ සඳහා HS Code වර්ගීකරණ කමිටුවක විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණු අතර මෙම මාළු තොගය නරක් වූ ස්වභාවයක් ගෙන ඇති බව වාර්තා කළ ද, HS Code 511.91.10 යටතේ Whole Round Tuna In Bulk ලෙස රේගු සටහන්කරයේ ඇතුළත් කර ඒ අනුව රේගුව විසින් රු. 6,288,357 බදු අයකරගෙන තිබුණි. | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලැබෙන තෙක් රඳවා ඇත. | අවස්ථාවක් බැවින් වර්ගීකරණය පිළිබඳ අපැහැදිලිතාවක් ඇති අතර එවිට "වර්ගීකරණ කමිටුවක්" වෙත යොමු කිරීම අවශ්‍ය බව. |
| **(ii)** | සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට අප-මාළු (Fish-Waste) අඩංගු බහාලුම් 98 න් බහාලුම් 40ක තිබුණු නරක් වූ මාළු කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා නොගෙන අවස්ථා 3 ක දී තායිලන්තයට හා මැලේසියාවට ප්‍රතිඅපනයනය කර තිබුණි. කාබනික පොහොර නිෂ්පාදනය සඳහා බහාලුම් 43 ක් යොදාගත් බවට ආනයන හා අපනයන පාලකවරයා විසින් වාර්තා කර තිබුණු අතර ඉතිරි බහාලුම් 15 හි ඇති නරක් වූ මාළු තවදුරටත් පෞද්ගලික ගබඩාවක රඳවා තිබුණි. කෙසේවුවද, කාබනික පොහොර සැකසීමට යැයි පවසමින් රට තුළට ගත් මාළු බහාළුම් 40ක්ම එකී කාර්යයට යොදා නොගෙන ප්‍රතිනැව්ගත කිරීමට ඉන් වසරකට පමණ පසු කටයුතු කිරීමෙන් ශ්‍රී ලංකා රේගුවේ මුල් තීරණය වැරදි බව තවදුරටත් තහවුරු වී තිබුණි. | මෙමගින් පෙන්වා දී ඇති පරිදි දැනට ඉතිරිවී ඇති බහාලුම් 15 ප්‍රතිඅපනයනය සඳහා නොව කාබනික පොහොර නිෂ්පාදනය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලැබෙන තෙක් රඳවා ඇත. | තීරණ ගැනීමේදී වඩාත් විචක්ෂණශීලී විය යුතු බව. |

## 3.4 විශේෂ විගණන වාර්තාව

පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද 2024 අප්‍රේල් 09 දිනැති අංක එස් පී ආර්/2024/01 දරන " ශ්‍රී ලංකා රේගුවේ පවතින විවිධ අරමුදල් කළමනාකරණය/ පරිපාලනය" සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව ජාතික විගණන කාර්යාලයේ වෙබ් අඩවිය වන naosl.gov.lk (https:naosl.gov.lk/web/index.php/en) වෙතින් බාගත හැකිය.